උපාධි ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකයක් ලබා තිබීම හෝ ඊට වඩා ඉහළ උසස් අධ්‍යාපන සුදුසුකමක් ලබා තිබීම.

1.2 ආයුර්වේද පර්යේෂණායතනයේ වෛද්‍ය නිලධර (පර්යේෂණ) ගණය :

(*අ*) ආයුර්වේද පර්යේෂණායතනයේ වෛද්‍ය නිලධර (පර්යේෂණ) ගණයේ පළමු ශ්‍රේණියේ නිලධරයෙකු විම; හා

(*ආ*) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ III පරිශිෂ්ටයේ දක්වා ඇති අයුරු පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජය පිළිගත් පශ්චාත් උපාධි ආයතනයකින් පශ්චාත් උපාධි සහතිකයක් ලබා තිබීම;

*නැතහොත්*

(*ඇ*) ආයුර්වේද පර්යේෂණායතනයේ වෛද්‍ය නිලධර (පර්යේෂණ) ගණයේ දෙවන ශ්‍රේණියේ වසර අට (08) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම; හා

(*ඈ*) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ III පරිශිෂ්ටයේ දක්වා ඇති අයුරු පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් පශ්චාත් උපාධි ආයතනයකින් ලබාගත් පශ්චාත් උපාධි සහතකියක් ලබා තිබීම;

*නැතහොත්*

(*ඉ*) රාජ්‍ය හෝ පළාත් පාලන සේවයේ වෛද්‍යවරයෙකු වශයෙන් වසර පහළොවක (15) කට නොඅඩු සතුටුදයක සේවා කාලයක් තිබීම, හෝ රාජ්‍ය සහ පළාත් පාලන සේවාවන්හි වෛද්‍යවරයෙකු වශයෙන් වසර පහළොවක (15) ට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම; හා

(*ඊ*) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ III පරිශිෂ්ටයේ දක්වා ඇති අයුරු පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් පශ්චාත් උපාධි ආයතනයකින් ලබාගත් පශ්චාත් උපාධි සහතිකයක් ලබා තිබීම; හා

(*උ*) ආයුර්වේද පර්යේෂණ පිළිබඳ විශිෂ්ට පළපුරුද්දක් ඇත්තාවූ වෛද්‍ය නිලධරයෙකු වීම.

1.3 දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ වෛද්‍ය නිලධර (අධ්‍යාපන) ගණය :

(*අ*) දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳව ජාතික ආයතනයේ වෛද්‍ය නිලධර (අධ්‍යාපන) ගණයේ පළමුවන ශ්‍රේණියේ නිලධරයෙකු වීම ; හා

(*ආ*) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ III පරිශිෂ්ටයෙහි දක්වා ඇති අයුරු රජය පිළිගත් පශ්චාත් උපාධි ආයතනයකින් ලබාගත් පශ්චාත් උපාධි සහතිකයක් ලබා තිබීම; *නැතහොත්*

(*ඇ*) දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ වෛද්‍ය නිලධර (අධ්‍යාපන) ගණයේ දෙවන ශ්‍රේණියේ වසර අට (08) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම; *නැතහොත්*

(*ඈ*) රාජ්‍ය හෝ පළාත් පාලන සේවයේ වෛද්‍යවරයෙකු වශයෙන් වසර පහළොව (15) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම, හෝ රාජ්‍ය සහ පළාත් පාලන සේවාවන්හි වෛද්‍යවරයෙකු වශයෙන් වසර පහළාව (15) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම; හා

(*ඉ*) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ III පරිශිෂ්ටයෙහි දක්වා ඇති අයුරු පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජය පිළිගත් පශ්චාත් උපාධි ආයතනයකින් පශ්චාත් උපාධි සහතිකයක් ලබා තිබීම; හා

(*ඊ*) ඉගැන්වීම් කටයුතු පිළිබඳ ප්‍රමාණවත් පළපුරුද්දක් ඇත්තාවූ වෛද්‍ය නිලධරයෙකු වීම,

02. 2.1 ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධර ගණ තුනෙහි (03) අධි ශ්‍රේණියට උසස්වීම් කරනුයේ, වාර්ෂික ඇස්තමේන්තුවලින් අනුමත තනතුරු සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා පමණකි.

2.2 අනුමත තනතුරු සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමේදී උසස්වීම් කරනුයේ සෑම වර්ෂයකම ජනවාරි මස 01 දිනට හෝ ජූලි මස 01 දින සිට බලපැවැත්වෙන අයුරිනි.

***සටහන*** : තෝරා ගැනීමේදී ජ්‍යෙෂ්ඨතාවය පළපුරුද්ද හා කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිල්ල දක්වනු ලැබේ.

03. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 16 කි.

(i) 2014.07.01 දින සිට 2017.07.01 දින දක්වා සෑම සය මසකම ඇති වූ අධි ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා (*උදා* : 2014.07.01 දිනට, 2015.01.01 දිනට, 2015.07.01 දිනට... ආදී වශයෙන්) උසස්වීම් සිදුකරන බැවින් එම දිනයන් වන විට ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

(ii) විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඉහත සුදුසුකම් සපුරා ඇති ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

04. මේ සමග දැක්වෙන ආකෘතිය ප්‍රකාරව (අයදුම්පත www.ayurveda.gov.lk) ඔස්සේද ලබාගත හැක.) සකස් කරන ලද අයදුම්පත් 2020.07.10 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව,

10. ලබා ඇති වෙනත් අධ්‍යාපන සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ නම | කාලය | සම්පූර්ණ කළ දිනය (පුහුණු කාලය ඇතුළත්ව) |
|---|---|---|---|
| | | | |
| | | | |

11. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ නිලධරයා විසින් සිදු කරන ලද ප්‍රකාශන
   i. ……………………………
   ii. ……………………………

12. භාෂා ප්‍රවීණතාවය
   i. දෙවන භාෂා ප්‍රවීනතාව (සිංහල/දෙමළ) වර්ෂය :————.
   ii. සන්ධාන භාෂාව වර්ෂය :————.

13. වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

| වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට හේතුව | නිවාඩු කාල සීමාව සිට දක්වා | ලබාගත් නිවාඩු ප්‍රමාණය අවු. මාස දින |
|---|---|---|
| | | |

14. ඔබගේ සේවා කාලය තුළ කුමන හෝ අවස්ථාවක ඔබට විරුද්ධව විනයානුකූලව පියවර ගෙන තිබේ ද? (එසේ නම්) :

| විනය තීරණය | චෝදනා පත්‍රයට අනුව වරද සිදු වූ කාල සීමාව |
|---|---|
| | |
| | |

මවිසින් ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. අයදුම්පත් කැඳවීමේ චක්‍රලේඛයේ සඳහන් කර ඇති සියලුම සේවා නියමයන් හා කොන්දේසිවලට මා එකඟ වන බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ හා නිර්දේශය
………………………… මයා. /මිය. /මෙනවිය විසින් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත මේ සමඟ ඉදිරිපත් කරනු ලබන අතර, එහි සඳහන් තොරතුරු නිවැරදි බවත්, පූර්වාසන්න වසර 05 තුළ නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇති/නොමැති බවත් සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :————.

* ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06-258

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.